**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**<u>රුපියල් මිලියන 100,000 ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව</u>**

2026 අප්‍රේල් මස 09 වැනි දින 09.75%2030 ‘A’ කාණ්ඩය යටතේ රුපියල් මිලියන 30,000ක, 10.75%2034 ‘A’ කාණ්ඩය යටතේ රුපියල් මිලියන 40,000ක සහ 10.75%2037 ‘A’ කාණ්ඩය යටතේ රුපියල් මිලියන 30,000ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කෙරේ. මෙම නිකුතුවට අදාල විස්තර පහත දැක්වේ.

| කාණ්ඩය | **09.75%2030 ‘A’** | **10.75%2034 ‘A’** | **10.75%2037 ‘A’** |
|---|---|---|---|
| සු.හ.ජා. අංකය (ISIN)* | LKB00530G018 | LKB00934F154 | LKB01237G019 |
| වෙන්දේසියට ඉදිරිපත් කරන ප්‍රමාණය | රුපියල් මිලියන 30,000 | රුපියල් මිලියන 40,000 | රුපියල් මිලියන 30,000 |
| පොලී අනුපාතිකය | වර්ෂයකට සියයට 09.75% | වර්ෂයකට සියයට 10.75% | වර්ෂයකට සියයට 10.75% |
| නිකුතුවේ දිනය | 01 ජූලි 2025 | 15 ජූනි 2025 | 01 ජූලි 2025 |
| **කල් පිරෙන දිනය** | **01 ජූලි 2030** | **15 ජූනි 2034** | **01 ජූලි 2037** |
| පොලී ගෙවන දිනයන් | ජනවාරි 01 සහ ජූලි 01 වැනි දින | ජූනි 15 සහ දෙසැම්බර් 15 වැනි දින | ජනවාරි 01 සහ ජූලි 01 වැනි දින |
| උපචිත පොලිය | රුපියල් 100 ක් සඳහා රු. 2.8011 | රුපියල් 100 ක් සඳහා රු. 3.5735 | රුපියල් 100 ක් සඳහා රු. 3.0884 |
| වෙන්දේසි කරන දිනය | 2026 අප්‍රේල් මස 09 වැනි බ්‍රහස්පතින්දා දින | | |
| ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | 2026 අප්‍රේල් මස 09 වැනි බ්‍රහස්පතින්දා පෙ.ව. 11.00 ට | | |
| **ගෙවීම් කළ යුතු දිනය** | **2026 අප්‍රේල් මස 15 වැනි දින** | | |
| ටෙන්ඩර් සඳහා අවම මුදල | රුපියල් මිලියන පහක් (රු. 5,000,000) සහ ඉන් අනතුරුව රුපියල් මිලියනයේ (රු. 1,000,000) ගුණිතයන්ගෙනි | | |

ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. ලංසු ඉදිරිපත් කළ යුත්තේ සපයනු ලැබ ඇති විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පහසුකම මගින් පමණකි. පොලිය ගෙවූ අවසාන දිනයේ සිට පියවීම කරනු ලබන දිනට උපචිත පොලිය රහිත මිල පදනම් කර බැඳුම්කර සඳහා ලංසු කැඳවනු ලැබේ. ඉහත සඳහන් පරිදි ලංසුවක් සඳහා වන අවම මුදලට අනුගත වෙමින් අපේක්ෂිත ආයෝජකයන්ට (මහජනතාව හෝ වෙනත් ඕනෑම ආයෝජකයෙකුට) පහත සඳහන් ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

**ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ලැයිස්තුව**

| | | | |
|---|---|---|---|
| ලංකා බැංකුව | 2541938 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පී.එල්.සී. | 2639883 |
| කැපිටල් එලයන්ස් පී.එල්.සී. | 2317777 | මහජන බැංකුව | 2206783 |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. | 2332319 | සම්පත් බැන්ක් පී.එල්.සී. | 2305842 |
| එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 2425010 | සෙලාන් බැන්ක් පී.එල්.සී. | 2456340 |
| එච්.එන්.බී සෙකියුරිටීස් ලිමිටඩ් | 2206297 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් | 2675096 |

වෙළඳ පොල තත්ත්වයන් මත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් එක් එක් කාණ්ඩය යටතේ වෙන්දේසියට ඉදිරිපත් කළ ප්‍රමාණයට නොවැඩි ඕනෑම ප්‍රමාණයක් පිළිගනු ලැබිය හැකිය.
අපේක්ෂිත ආයෝජකයන්ට ප්‍රාථමික අලෙවිකරුවන් හෝ අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ද්විතියික වෙළඳ පොළෙන්ද භාණ්ඩාගාර මිලදී ගත හැකිය.

* සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය


**<u>නිකුත් කරන කාර්යාලය</u>**
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
ලේකම් කාර්යාලය, කොළඹ 1.
දුරකථන : +94 112 484 604
www.treasury.gov.lk

උදේනි උඩුගහපත්තුව
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය